# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) - 2012**
**2015 මාර්තු - මැයි**
**සමාජීය විද්‍යා පීඨය**

**මානව විද්‍යාව - ANTH - E 2015**

**ශ්‍රී ලංකාවේ වැදි ජනතාව**

**ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.**

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. ශ්‍රී ලාංකේය වැදි ජනයා තුළ විද්‍යාමාන වන ප්‍රාථමික සමාජයක් සතු ලක්ෂණ මොනවාද? පැහැදිලි කරන්න.

02. අතීත හා වර්තමාන වැදි ජනාවාස අතර සන්සන්දනාත්මක අධ්‍යයනයක් කරන විට වැද්දන්ගේ මුල් වාස භූමි ව්‍යාප්තිය, වර්තමාන ව්‍යාප්තිය හා පැහැදිලි වෙනස්කමක් දක්වයි ද/ නැද්ද යන්න හේතු සහිතව සාකච්ඡා කරන්න.

03. අතීත වැදි ජනයා තමාගේ දෛනික අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ස්වාභාවික පරිසරය ඇසුරු කිරීමේ දී යොදා ගනු ලබන විවිධ උපක්‍රමවල ඇති සුවිශේෂතා පිළිබඳ විශ්ලේෂණයක් කරන්න.

04. ශ්‍රී ලංකාවේ වැදි ජනයා පිළිබඳ ආරම්භයේ සිට අද දක්වා සිදු කෙරී ඇති පර්යේෂණ දෙස බලන විට එළඹිය හැකි නිගමනයන් කෙබඳු දැයි සමාලෝචනය කරන්න.

05. ඇමරිකානු මානව විද්‍යාඥයින් විසින් ඉදිරිපත් කරනු ලැබූ විවිධ මතවාද, න්‍යායන් , සංකල්ප ශ්‍රී ලංකාවේ වැදි ජනයා තුළ කොතෙක් දුරට විද්‍යාමාන වේද යන්න මානව විද්‍යාත්මක දෘෂ්ටියකින් සාකච්ඡා කරන්න.

06. අතීත වැදි ජනයා තුළ ස්ථාපිතව පැවති වැදි වරිග කවරේදැයි විස්තර කරන්න.

07. ශ්‍රී ලංකාවේ වර්තමානය වනවිටත් යම්තාක් දුරකට හෝ තම අනන්‍යතාවය ආරක්ෂා කර ගැනීමේ උත්සාහයක නිරතවන සුවිශේෂී ජීවමාන උරුමයක් වන වැදි ජනතාව රැක ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳ යෝජනාවලියක් සකස් කරන්න.

**හෝ**

ඔබ කැමති එක් වැදි ජන ප්‍රදේශයක් කේන්ද්‍ර කරගනිමින් වැදි ජන බස්වහර වෙනස්වීම් වලට ලක්වීමට බලපා ඇති හේතු සාධක පිළිබඳ විමර්ශනාත්මක ඇගයීමක් කරන්න.

08. පහත සඳහන් මාතෘකා අතරින් **දෙකක් (02)** පිළිබඳ විස්තර කරන්න.

1. වැදි ජනයාගේ කුටුම්භ ජීවිතය
2. වැදි ජනයා පිළිබඳ කෙරී ඇති භෞතික මානව විද්‍යාත්ක පර්යේෂණ
3. වැදි ජනතාවගේ මසුන් ඇල්ලීමේ ක්‍රම
4. වැදි ප්‍රභවය පිළිබඳ ඇති මතවාද

*************************